**කුරුණෑගල වැව්ලි සමාගම - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල වැව්ලි සමාගමෙහි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කහ වගාව සඳහා 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ සඳහා ගෙවන ලද එකතුව රු.8,432,049 ක් ගිණුම්ගත කර තිබුණ ද මෙම වියදම ගැලපුම් සංකල්පයට අනුව දරන ලද වර්ෂයන්වල උපයන ලද ආදායමට එරෙහිව කපා හැරීම නොකර ජංගම වත්කම් වල සටහන් කර තිබීම නිසා ජංගම වත්කම් හා සමුච්චිත ඉපයීම් එම අගයෙන් අධිගණනයවී තිබුණි. | කුරුණෑගල වැවිලි සමාගම විසින් 2022 සහ 2023 වර්ෂ වලදී කෙටිකාලීන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් ලෙස රු.8,432,049ක ශේෂය වර්ෂ අවසානයේදී පවතී. අදාල ව්‍යාපෘති වල ඵලදාව ලැබීමත් සමග ඉහත වියදම් ලාභයට එරෙහිව ගැලපීම් කරනු ඇත. | කෙටි කාලීන වගාවක් වන කහ වගාව සඳහා දරන ලද වියදම ගැලපුම් සංකල්පයට අනුව දරන ලද වර්ෂයන්වල උපයන ලද ආදායමට එරෙහිව කපා හැරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5 (1) උප වගන්තිය. | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින තිහක් ඇතුළත පාරිතෝෂික මුදල් එම තැනැත්තාට හෝ ඔහුගේ හෝ ඇයගේ උරුමකරුවන්ට ගෙවිය යුතු වුවද, සමාගමේ 2023 වර්ෂය සඳහා රු.1,251,575ක ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකමක් පැවති අතර එහි දින 180ට වැඩි හිඟ ප්‍රමාණය රු. 680,410 ක් විය. එසේම ඊට පෙර වර්ෂයන්ට අදාල හිඟ පාරිතෝෂික මුදල රු.1,073,558ක් වූ අතර නියමිත දිනට පාරිතෝෂික මුදල් නොගෙවීම හේතුවෙන් 2023 වර්ෂය අවසාන වන විට සමාගමට රු.9,000,748ක අධිභාරයක්ද ගෙවීමට සිදුවී තිබුණි. | 2023 වර්ෂය අවසාන වන විට නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම මත අධිභාරය ලෙස රු.මි. 19 ක් සමාගමට ගෙවීමට සිදු වී ඇත.මෙම තත්වය උද්ගත වනු ලැබුවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් 2016/04/19 වන දින යොමු කළ විමසුම මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද නෛතික ක්‍රියාමාර්ග අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කර ඇත. ඒ අනුව සමාගම විසින් පාරිතෝෂික ගෙවීම සඳහා පෙර ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදයම නැවත ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇත. | විගණන විමසුමක් මහින් කරුණු පැහැදිලි කර ගැනීමක් පමණක් සිදුවන බැවින් නෛතික තත්ත්වය මත නිවැරදි තීරණවලට එළඹීමට සමාගම විසින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2010 දෙසැම්බර් 01 දිනැති අංක KP/2010/22 දරන අභ්‍යන්තර | පළාත් වතු කාර්යාලවල මුදල් ලැබීම් වටිනාකම රු.50,000 ඉක්මවන අවස්ථාවලදී එම මුදල් කඩිනමින් බැංකු ගත කළ යුතු | වතුයායන්වල පවතින ප්‍රායෝගික හේතූන් නිසා වැඩිපුර මුදල් ප්‍රමාණයක් මාසය අවසානයේ අතැති මුදල් ලෙස | අභ්‍යන්තර චක්‍රලේඛ නිවැරදිව හා ක්‍රියාත්මක කිරීමට හැකි පරිදි |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛය | වුවද නාරම්මල හා දඹදෙනිය පළාත් වතු කාර්යාල භෞතික පරීක්ෂාවේදී අතැති මුදල් ශේෂය පිළිවෙළින් රු.278.923ක් හා රු.265,330ක් වී තිබුණි. | රඳවා තබාගෙන ඇති අතර ඉදිරියේදී අතැති මුදල් ප්‍රමාණය අප විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව පවත්වාගෙන යාමට වතුයායන්ට උපදෙස් ලබා දී ඇත. | සකස් කිරීමට හා විධිමත් අනුමැතින් මත එම චක්‍රලේඛ සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ බදු පසු මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 476.61 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 472.37 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 4.24 කින් එනම් සියයට 1කින් වර්ධනය වී තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම මත ලාභය රු.මිලියන 56.53කින් වැඩිවීමත් රබර් ගස් විකිණීමේ ආදායම රු. මිලියන 18.8කින් වැඩිවීමත් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2023 (රු) | 2022 (රු) | විචලනය (රු) | විචලනයේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| අයභාරය | 1,010,951,819 | 1,065,494,048 | (54,542,229) | 5 |
| මූල්‍ය හා අනෙකුත් ආදායම් | 360,781,268 | 254,961,766 | (105,819,502) | 42 |
| විකුණුම් පිරිවැය | 563,224,713 | 549,558,623 | (13,666,090) | 2 |
| පරිපාලන වියදම් | 226,833,617 | 223,251,034 | (3,582,584) | 2 |
| මූල්‍ය වියදම් | 47,244,012 | 36,106,755 | (11,137,257) | 31 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයන් 5:1 ක් හා 5:1ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් 4:1ක් හා 4:1 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 44 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතය වූ සියයට 48 සමඟ සැසඳීමේදී දළ ලාභ අනුපාතය සියයට 4 කින් පිරිහී තිබුණි.
- සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 47 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතය වූ සියයට 44 සමඟ සැසඳීමේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 3 කින් වර්ධනයවී තිබුණි.

## 1.7. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ දඹදෙණිය පළාත් වතු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.6,500,000ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු නමුත් 2020 වර්ෂයේ සිට 2024 ජනවාරි මාසය දක්වා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.7,038.605ක් වැයකර තිබුණු අතර එය ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.538,605ක වැඩිවීමක් බවත්, ගොඩනැගිල්ලේ වැඩ මෙතෙක් නිමකර නොමැති නිසා වියදම තව දුරටත් වැඩිවිය හැකි බවත් නිරීක්ෂණය විය. ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වියදම් දැරීම පිළිබඳ අනුමැතියක්ද ලබා ගෙන නොතිබුණි. මෙම ඉදිකිරීමට අදාලව ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර, ඊට අදාලව මැනුම්පත් මගින් වියදම් තහවුරු කිරීමක්ද සිදු කර නොතිබුණි. | මේ සඳහා ප්‍රමාණ පත්‍රයක් සකස් කර තිබූ අතර ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. ඉදිරියේදී සිදු කරනු ලබන කාර්යයන් සඳහා ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. අවශ්‍යතාවය අනුව භාණ්ඩ මිලදී ගන්නා අතර එම භාණ්ඩ තොග පොතට ඇතුල් කර නිකුත් කිරීමේ සටහන් යොදා පරිහරණයට ගෙන ඇත.<br>පසුගිය කාලය තුළ භාණ්ඩ හා සේවා මිල අසාමාන්‍ය ලෙස ඉහල යාම හේතුවෙන් මෙහි වැඩ කටයුතු අවසාන කිරීම සඳහා තවත් අමතර මුදලක් වැය කිරීමට සිදු වී ඇත. | ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණ පත්‍රයක් හා ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ අනුව අවශ්‍ය ද්‍රව්‍ය හා ප්‍රමාණ මිලදී ගැනීම තුළින් වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමණාකරන අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට පොල් නිෂ්පාදන ණයගැති ශේෂය වූ රු.63,510,576 ක් තුළ අවුරුදු 03 හා 08 ඉක්මවූ පිළිවෙලින් රු.1,688,527 ක සහ රු.4,677,838 ක ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි. | මෙම ණයගැතියන්ගෙන් ණය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | දිගුකාළීන ණයගැති ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| හිරියාල පළාත් වතු කාර්යාලයට අයත් වතු 07 ක සවිකිරීමට 2023 දෙසැම්බර් මාසයේ මිලදීගෙන තිබුණු රු.974,500 ක් වටිනා CCTV කැමරා උපකරණ, අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන හා ස්ථාවර වත්කම් ලේඛනයට ද ඇතුළත් නොකර ගනේවත්ත ගබඩාව තුළ පැවැති බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | මෙම සවිකිරීම වතු අධිකාරිවරයා විසින් සිදු කරන නිසා ප්‍රමාද විය. එය ජුනි මස 15 වන විට නිම කිරීමට ඔහු විසින් එකඟ වී ඇත. | CCTV කැමරා උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර අරමුණුගත කාර්යය සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |